


# බ්ලෙෆරයිටීස්

## බ්ලෙෆරයිටීස් යනු කුමක්ද?

ඇසි පිය වල කෙළවර ඇති ඇසි පිහාටු වටා ඇතිවන ආසාදනය බ්ලෙෆරයිටීස් නමින් හඳුන්වයි. ඇසිපිය වල ඇති ග්‍රන්ථි වලින් නිපදවන ස්‍රාවයන් මගින් ඇසේ තෙතමනය පවත්වා ගනී. මෙම ග්‍රන්ථි ක්‍රමානුකූලව වැඩ නොකිරීමෙන් මෙම තත්වය ඇතිවේ.

## ප්‍රතිකාර කරන්නේ කෙසේද?

තාවකාලිකව ඇසට දමන බිංදු භාවිතා කළ හැක. එනමුත් දීර්ඝ කාලීනව ඇසිපිය හොඳින් පිරිසිදු කිරීම මගින් මෙය වළක්වා ගත හැක.

## ඇසි පිය පිරිසිදු කිරීමේ නිවැරදි ක්‍රමය

- බේබි ෂැම්පු බිංදු 6 ක් උණුකර නිවාගත් වතුර කෝප්පයකට එක්කර ද්‍රාවණයක් සාදා ගන්න.
- එම ද්‍රාවණයෙන් කොටන් බඩ් එකක් ආධාරයෙන් ඇසි පිය කෙළවර හොඳින් පිරිසිදු කර ගන්න.
- දිනකට කිහිප වතාවක්වත් මේ ආකාරයට ඇස පිරිසිදු කර ගන්න.
- ඇස තුළට ෂැම්පු යාම වළක්වා ගන්න.
- මෙම ප්‍රතිකාරය දිනකට එක් වතාවක්වත් අවම වශයෙන් සති 6 ක් දක්වා කළ යුතුය.
- රෝගය පාලනය වූ පසුවත් දින චර්යාවේ කොටසක් ලෙස මෙලෙස පිරිසිදු කිරීම දිනපතා කළ යුතුය.



GOLDEN KEY
HOSPITALS LIMITED
NO. 511/3 COTTA ROAD, RAJAGIRIYA, SRI LANKA
TEL : +94 11 2880288
FAX : +94 11 2880278
E-mail : info@eyeandent.lk
Web : www.eyeandent.lk